# 9 ආගන්තුක සත්කාරය

## විමලරත්න කුමාරගම (1919-1962)



නූතන යුගයට අයත් දීප්තිමත් කවියකු වූ විමලරත්න කුමාරගම ලිපිකරුවකු ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කර පසු ව ප්‍රාදේශීය ආදායම් පාලක ධූරයට පත් විය. මොහු බිම්තැන්න, කොළොන්න, වන්නි හත්පත්තුව වැනි ඉතා නොදියුණු හා දුෂ්කර ප්‍රදේශවල සේවය කිරීමෙන් ලත් නිර්ව්‍යාජ ජීවන අත්දැකීම් දයානුකම්පාවෙන් යුතු ව ප්‍රතිනිර්මාණය කිරීමට උත්සාහ ගත් කවියෙකි. ගතානුගතික ආකල්පවලින් ඈත් ව සංයමශීලී ව හා මධ්‍යස්ථ මුහුණුවරකින් අත්දැකීම් ප්‍රතිනිර්මාණය කිරීමට පෙළඹුණු කවියකු ලෙස ඔහු ඇගයුමට පාත්‍ර වෙයි.

**සංවේග වේදනා** (1946), **නිල් සීනය** (1941), **ඔරුව** (1942), **හපුමලී** (1946), **සුරතල්ලු** (1961) යන පද්‍ය කෘති කුමාරගමගේ කාව්‍ය සංග්‍රහ අතර වේ. කලක් අගනුවර තරුණ කවි සමාජයේ සංස්කාරකවරයා ලෙස ද ඔහු කටයුතු කර තිබේ. අනවශ්‍ය භාවාත්මක බවින් මිදුණු ඉතා සංවේදී සංයමශීලී බව ද මුහුකුරා ගිය කවි ශක්තිය ද උචිතානුචිත භාවයෙන් පරිපූර්ණ භාෂා හා අලංකාර භාවිතය මොහුගේ කවියෙහි දක්නට ලැබෙන ගුණ ලෙස සැලකිය හැකි ය. මානව ජීවිතයෙහි හා ස්වාභාවික පරිසරයේ අන්‍යෝන්‍ය බැඳීම නිර්ව්‍යාජ ලෙස සියුම් නිරීක්ෂණාක්ෂියකින් යුතු ව ප්‍රතිනිර්මාණය කිරීම කරණ කොට සමකාලීන සෙසු කවීන් අතුරින් මොහු සුවිශේෂ කොට හැඳින්වේ. රාජ්‍ය සේවයෙහි පිළිගත් වෘත්තිකයකු ලෙස මොහු විසින් ගොඩ නගා ගන්නා ලද සමාජ භූමිකාව ඒ සඳහා මොහුට මහෝපකාරී විය.

ගන්තුන තුලානේ අලියා වැටුණු වැ වේ
සුන්දර හාමි එතරම් පොහොසතෙක් නො වේ
තුන්ලාහකම බිම වැඩකර දියෙන් වැ වේ
රන් වන් කරල් බරවී දැන් බිමට නැ වේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු වර
තවමත් සිතේ ඇත අමතක නොවන යුර
හේනට ගොසින් ගෙන් හූවක් තරම දුර
එනවා දිටිමි මිටි බැඳ ගෙන වියලි දර

දරටික තබා සෙවණැති පලු ගසක යට
පිස දම දමා දාඩිය එන නළල පිට
මා එන තුරුම සිට පෙන්වූ සිනහ කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර මට

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
දුප්පත් කමයි හැම තැන ලකුණුව ඇත්තේ
කෙලෙසද කියා කළ ගුණ සැලකිය යුත්තේ
දුන් සත පණහවත් ඔහු නැත පිළි ගත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු නැති
හිතවත් කමින් සැලකූ යුතුකමය සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුතී
සිහිවී මගේ කම්මුල රතු පැහැය ගතී

## ලිඛිත අභ්‍යාස

1. 'ආගන්තුක සත්කාරය පැදි පෙළ සාර්ථක නිර්මාණයකි.' අදහස් දක්වන්න.
2. විමලරත්න කුමාරගමගේ කවි ප්‍රතිභාව 'ආගන්තුක සත්කාරය' පද්‍ය පංතිය ඇසුරෙන් විමසන්න.
3. මේ පැදි පෙළට වස්තු විෂය වී ඇති අත්දැකීම කෙටියෙන් විවරණය කරන්න.